
# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# ANNUAL PERFORMANCE REPORT

# 2024 වර්ෂය




පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන,
සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය.

උතුරු මැද පළාත.

ඇමුණුම - 01

# 2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, උතුරු මැද පළාත.

## වැය ශීර්ෂ අංකය - 620

## අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. ආයතනය පිළිබඳ හැඳින්වීම

පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන සහ සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ජාතික ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් පළාත් ප්‍රතිපත්ති ක්‍රියාවට නංවාලන උතුරු මැද පළාතේ කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු යන අංශයන්ගෙන් පළාත සංවර්ධනය කරා මෙහෙයවනු ලබන බලාත්මක පළාත් රාජ්‍ය ආයතනය වේ. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන දෙක වන අතර, පළාතේ මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්තයට අදාළ වැඩසටහන් අමාත්‍යාංශය මගින් සිදුකෙරේ.

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය සඳහා විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම, අලෙවිය හා තාක්ෂණික සංවර්ධනය, කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත වැඩිදියුණු කිරීම, කෘෂිකර්මය ආශ්‍රිත ආයතනවල කටයුතු ශක්තිමත් කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි. නියෝජ්‍ය කෘෂිකර්ම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය හා මහ ඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය හා සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 6 ක් හා කෘෂිකර්ම උපදේශන කාර්යාල 32 ක් ඔස්සේ කෘෂිකාර්මික ජනතාව වෙනුවෙන් සේවා සැපයීම් සිදු කරනු ලබයි.

එමෙන්ම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සම්බන්ධ සංවර්ධන කටයුතු සිදුකරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුළ පශු සම්පත් නිෂ්පාදනය හා ඵලදායිතාව වර්ධනය, සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත ආදායම් උත්පාදන හා අලෙවි වැඩසටහන්, සත්ත්ව සෞඛ්‍ය සංවර්ධනය හා ආයතනික ධාරිතාව වැඩිදියුණු කිරීම වැනි සංරචක ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය අනුරාධපුර, දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය පොළොන්නරුව, තිරප්පනේ සත්ව ගොවිපළ, පශු වෛද්‍ය රෝහල හා පශු වෛද්‍ය කාර්යාල 29 ක් ඔස්සේ සේවා සැපයීම් සිදු කරනු ලැබේ.

මිරිදිය ධීවර විෂයට අදාළව ධීවර නිෂ්පාදිත වර්ධන වැඩසටහන්, අලෙවි ප්‍රවර්ධන හා ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම් හා අධීක්ෂණ ක්‍රියාවලිය ද අමාත්‍යාංශය මගින් සිදුකෙරේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව මුහුණ දී ඇති වත්මන් ආර්ථික හා සමාජයීය අර්බුදකාරී වාතාවරණය තුළ පළාතේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සතු සුවිශාල වගකීමකි. එමෙන්ම පළාතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ව්‍යවසායකයන් මෙහෙයවීම හා අධීක්ෂණය, ඔවුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, පසු විපරම් කටයුතු හා ඔවුන්ගේ කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමද අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.

සියලු සංවර්ධන කාර්යයන් සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනවලද සහයෝගය ලබා ගනිමින් පළාතේ කෘෂි ,සත්ත්ව නිෂ්පාදන සහ ධිවර අංශ පුළුල්කර ප්‍රධාන වශයෙන් ස්වයංපෝෂිත ආර්ථිකයක් තුළින් පළාතේ ජන දිවිය ශක්තිමත් කිරීම අමාත්‍යාංශයේ අරමුණ වී ඇත.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම** - "ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක්."

**මෙහෙවර** - "කෘෂිකර්ම, කෘෂි හා සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

**දිගු කාලීන අරමුණු**

- ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් පළාත් ප්‍රතිපත්ති භාවිතා කරමින් වැඩ සටහන් සැලසුම් කර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සම්ප්‍රදායන් රැක ගනිමින් සහ නවීන තාක්ෂණයට අනුගත වෙමින් කෘෂිකර්මාන්තයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම .
- පළාතේ 80% ක් පමණ වූ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම .
- තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගත හැකි පරිදි කෘෂිකාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය.
- ධීවර කර්මාන්තයේ මිරිදිය ධීවර කර්මාන්ත තුළ ජාතික නිෂ්පාදනය සඳහා වැඩිම දායකත්වයක් සපයන පළාත බවට පත්කිරීම .
- ධීවර හා විසිතුරු කර්මාන්තයේ නියැලෙන පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධනය කිරීම.

**කෙටි කාලීන අරමුණු**

- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දෙක මගින් සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වර්ෂය තුළ නිමකිරීම.
- නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද තාක්ෂණය පිළිබඳ දැනුමෙන් පිරි ගොවි ජනතාවක් බිහි කර ගැනීම.
- වස විස නැති ආහාර නිෂ්පාදනයට හා පරිභෝජනයට යොමු වන පිරිස වර්ධනය කිරීම .
- සුළු පරිමාණ ව්‍යාවසායකයින්ට අවශ්‍ය සානුබල සැපයීම තුළින් ඔවුන්ගේ ආර්ථිකමය හැකියාව ශක්තිමත් කිරීම .
- මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් ජාතික නිෂ්පාදනයට පළාතේ දායකත්වය වර්ධනය කිරීම .
- මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම .
- ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම .
- විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.
- දේශීය මෙන්ම විදේශීය වෙළඳපළ අරමුණු කර ගනිමින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම.

## 1.3 ආයතනයේ ප්‍රධාන කාර්යයන්


- අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු නියාමනය .
- ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
- කෘෂි අශ්‍රිත නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ආයතනික භෞතික සම්පත් සංවර්ධනය.

**ප්‍රධාන උපාය මාර්ගයන්**

- අධීක්ෂණය, පසුවිපරම හා ප්‍රගති සමාලෝචනය.
- ආයතනයේ චක්‍රලේඛ නිකුත් කිරීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- කෘෂි ව්‍යවසායකයන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන මගින් මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් ජලාශ සඳහා ලබාදීම.
- ධීවර කාර්මිකයන් සවිබල ගැන්විම.
- විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් සවිබල ගැන්වීම.

**1.4** සංවිධාන සටහන

<u>උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සංවිධාන සටහන</u>



**1.5 සේවා ජාලය**

1.5.1 අමාත්‍යංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, දෙපාර්තමේන්තු වල ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන.

I. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

II. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1.5.2 දෙපාර්තමේන්තු - දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන.

I. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- නියෝජ්‍ය කෘෂිකර්ම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය හා මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය.
- සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය 6ක් හා කෘෂිකර්ම උපදේශන කාර්යාලය - 32

II. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර.
- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව.
- සත්ත්ව ගොවිපළ, තිරප්පනේ.
- පශු වෛද්‍ය කාර්යාල -29

1.5.3 ව්‍යවස්ථාපිත ආයතන - යටතේ පවතින වෙනත් ආයතන හෝ සංවිධාන

- නැත

1.5.4 පළාත් පාලන ආයතන - යටතේ පවතින වෙනත් ආයතන හෝ සංවිධාන

- නැත

**1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේනතුව/ ව්‍යවස්ථාපිත ආයතනය/පළාත් පාලන ආයතනය සඳහා අරමුදල් ලැබෙන ප්‍රභවයන්.**

- සාමූහික ප්‍රධාන - 22
- පළාත් සභා සංවර්ධන ප්‍රධාන - 23
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන - 24
- ලෝක බැංකු ආධාර - 33

**1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති.**

අ) ව්‍යාපෘතියේ නම - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය.

ආ) දායක නියෝජිතායතනය - ලෝක බැංකු ආධාර හා ශ්‍රී ලංකා රජය.

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - ඇමරිකා ඩොලර් මිලියන 125.

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2019 සිට 2025 දක්වා

**2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

**2024 වර්ෂයේ සංවර්ධන දායකත්වය.**

**1.ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදාහැරීම.**

පළාතේ මත්ස්‍ය නිෂ්පාදිතය ඉහල නැංවීමේ අරමුණින් 2024 වසරේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද වැව් 113 ක් සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 4,730,597 ක් මුදාහැරීම සිදුකර ඇති අතර, මෙහිදී ප්‍රධාන වශයෙන්ම තිලාපියා, කැට් හා කාප් වර්ගයේ ඇඟිල්ලන් මුදාහැරීම සිදුවී ඇත. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේදී පළාතේ මත්ස්‍ය නිෂ්පාදිතයේ වර්ධනයක් පෙන්නුම් කරයි.

**2. මිරිදිය මත්ස්‍ය වගාකරුවන් 10 දෙනෙක් සඳහා මත්ස්‍ය තත්වාරෝපිත සිමෙන්ති ටැංකි ඉදිකිරීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.**

වැව් හා ජලාශ ඉතා විශාල සංඛ්‍යාවකින් සමන්විත උතුරු මැද පළාත මිරිදිය ධීවර නිෂ්පාදනය කෙරෙහි ඉතා විශිෂ්ට වූ හිතකර පාරිසරික විභවතාවයකින් සමන්විත පළාතකි. දැනට සමස්ත දිවයිනේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතයට 31 % ක් පමණ වූ දායකත්වයක් සැපයුව ද තව දුරටත් ඉතා ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් අත්කර ගැනීමේ හැකියාව පළාත සතුව ඇත. ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීමේ ක්‍රියාවලිය ඉහළ නිෂ්පාදන මට්ටමක් කරා අතිශයින් ම වැදගත් කාර්යභාරයක් සිදුකරයි. පළාත සතු වැව් හා ජලාශවලින් දැනට මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීමේ කටයුතු සිදුකිරීමේ හැකියාව පවතිනුයේ ඉතා සුළු ජලාශ ප්‍රමාණයක පමණි. ප්‍රමාණවත් පරිදි මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් නිෂ්පාදනය තුළින් තවත් ජලාශ රැසකට ප්‍රතිලාභ අත්කර දීමේ හැකියාව ජනනය වේ.

එබැවින් 2024 වසරේදී ද පෞද්ගලික මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 10 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන ලද්දේ මෙම ගැටළුවට පිළියමක් ලෙසිනි. මෙම අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය මඟින් ඉතා පහසුවෙන් පළාතට අවශ්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව මෙන් ම එම ව්‍යවසායකයන් මඟින් ග්‍රාමීය සේවා නියුක්ති අවස්ථා පුළුල් වීම හා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම ද අපේක්ෂිතය.

**3. විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය .**

අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිලාභීන් 41ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිලාභීන් 46 ක් ලෙස පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් 87ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි .

**4. උතුරු මැද පළාතේ මඩ පොකුණු හිමියන්ට 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය .**

අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිලාභීන් 11 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිලාභීන් 4 ක්, ලෙස පළාතේ මත්ස්‍ය නිෂ්පාදකයින් 15 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි .

**5. ධීවර කාර්මිකයින් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම.**

ආර්ථික අපහසුතා මැද ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර කාර්මිකයනට ආර්ථික ශක්තියක් වෙමින් ඔවුන්ගෙන් තෝරාගත් ධීවර කාර්මිකයන් 32 ක් සඳහා ඔරු ,කොල්ලෑ සහ ධීවර ආම්පන්න 50% ප්‍රතිලාභී දායකත්වය මත ලබා දීම සිදුකර ඇත.

**6. විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය සඳහා සිමෙන්ති ටැංකි ඉදි කිරීම ,අළුත්වැඩියා කිරීම ,වීදුරු ටැංකි සකස් කිරීමේ ව්‍යාපෘතිය .**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 17 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 24 ක් ද ලෙස පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් 41 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

**7. උතුරු මැද පළාතේ විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය සඳහා SOLAR විදුලි පද්ධතින් ලබාදීමේ ව්‍යාපෘතිය.**

අනුරාධපුර දිස්ත්‍රික්කයන් ප්‍රතිලාභීන් 02 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 03 ක් ලෙස පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් 05 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ විදුලි පද්ධතිය ලබාදී ඉන්පසු රජයේ 50% ප්‍රතිලාභී දායකත්වය වාරික වශයෙන් ගෙවීමට යටත්ව SOLAR **විදුලි** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

**8. උතුරු මැද පළාතේ විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.**

උතුරු මැද පළාතේ විසිතුරු මත්ස්‍ය වගාකරුවන්ගේ දැනුම, කුසලතා වර්ධනය කිරීමේ අදහසින් ධාරිතා සංවර්ධන වැඩසටහන් 04ක් පවත්වන ලදි. මේ යටතේ ප්‍රතිලාභීන් 160 දෙනෙක් සහභාගි විය.

ඕමාරකඩ ජලාශයේ මසුන් බහාලීම 2024/11/21





**2024.10.03** මාදුරු ඔය ජලාශයට මසුන් බහාලීම -පොළොන්නරුව







**2024.10.09 පහළ තලාව වැව, තලාව ජලාශයට මසුන් බහාලීම**








**2024.10.04 ළිදවැව ජලාශයට මසුන් බහාලීම - (නොච්චියාගම ලහිරු ෆාම්**







**මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය අංශයේ ඉදිරි වැඩසටහන්**

උතුරු මැද පළාත තුල මිරිදිය මෙන්ම විසිතුරු මත්ස්‍ය කර්මාන්තයන් වැඩි දියුණු කර උතුරු මැද පළාත තුල සිටින ජනතාවගේ ආර්ථිකය මෙන්ම පෝෂණ අවශ්‍යතාවයන් ඉහළ දැමීමේ අරමුණින් පහත දැක්වෙන වැඩසටහන් 2025 වසර තුල ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

01. උතුරු මැද පළාත තුල තෝරාගත් ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීමේ ව්‍යාපෘතිය.
02. මත්ස්‍ය වර්ධක පොකුණු ස්ථාපනය කිරීම.
03. 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම.
04. මිරිදිය ධීවර සමිති සාමාජිකයන්ගේ කළමනාකරණ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම හා ආකල්ප සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
05. අගය එකතු කිරීමේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන ප්‍රවර්ධනය සහ වෙළඳපොල පහසුකම් සංවර්ධනය.
06. විදුලි බලය නොමැති ධීවර තොටුපල සඳහා සූර්ය පැනල සවි කිරීම.
07. 50% ප්‍රතිලාභී දායකත්වය මත විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා සිමෙන්ති ටැංකි ඉදිකිරීම.
08. පාසල් ප්‍රජාව අතර විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
09. විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයන්ගේ ජල මූලාශ්‍ර සංවර්ධනය.
10. විසිතුරු මත්ස්‍ය ප්‍රදර්ශනයක් පැවැත්වීම.
11. විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා මූලික පුහුණුව හා අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම.
12. විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයන් සඳහා සූර්ය පැනල ලබා දීම.
13. විසිතුරු මත්ස්‍ය පොකුණු වල පැති බැම් සකස් කිරීම සහ වට ආවරණ ඉදිකිරීම.

ආර්.එම්.ජී.සේනාරත්න,

ලේකම්,

කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා
සත්ත්ව සෞඛ්‍ය,සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

## 03. පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**එන්සීපී-පීටී (එෆ්)**

පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය

උතුරු මැද පළාත.

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| **ප්‍රතිශෝධිත අයවැය 2024** | | සටහන | **තත්‍ය 2024** | **2023** | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **1** | - | - | ආර්-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **2** | - | - | ආර්-1 |
| **-** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **-** | **-** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| 1,163,655,000 | භාණ්ඩාගාර අග්‍රිම | | 797,930,000 | 1,153,949,000 | **ජී-1** |
| - | තැන්පතු | | 27,705,466 | 12,853,473 | **ජී-2** |
| 1,800,000 | අත්තිකාරම් ලැබීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 4,617,960 | 2,547,655 | **ජී-3** |
| - | අත්තිකාරම් ලැබීම් - අනුදත් අත්තිකාරම් | | - | - | **ජී-3** |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **1,165,455,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **830,253,426** | **1,169,350,128** | |
| **1,165,455,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **830,253,426** | **1,169,350,128** | |
| - | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 17,266,900 | 7,505,137 | |
| **1,165,455,000** | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **812,986,526** | **1,161,844,991** | |

**අඩුකළා : වියදම්**
**පුනරාවර්තන වියදම්**

| | | | | | |
|---|---|---|---|---|---|
| 44,385,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 3 | 34,390,107 | 29,911,985 | |
| - | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ - වෙනත් දෙපා: | 3 | - | - | |
| 16,770,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 4 | 10,963,692 | 6,976,826 | |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා - වෙනත් දෙපාර්තමේන්තු | 4 | - | - | |
| 3,300,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 5 | 288,427 | 347,656 | ඊ-3 |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් - වෙනත් දෙපාර්තමේන්තු | 5 | - | - | |
| **64,455,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **45,642,226** | **37,236,467** | |
| | **මූලධන වියදම්** | | | | |
| 25,200,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 6 | 5,282,645 | - | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - වෙනත් දෙපාර්තමේන්තු | 6 | 12,669,350 | - | |
| 69,800,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 7 | 1,639,352 | 860,830 | |
| - | මූලධන වත්කම් අත්පත් කර ගැනීම - වෙනත් දෙපාර්තමේන්තු | 7 | 27,013,177 | 62,786,744 | |
| 1,000,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 8 | 733,334,000 | 1,112,187,542 | ඊ-3 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් - වෙනත් දෙපාර්තමේන්තු | 8 | 177,404,853 | 42,433,259 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 9 | - | - | |
| 4,000,000 | හැකියා වර්ධනය | 10 | 183,760 | - | |
| - | වෙනත් මූලධන වියදම් | 11 | - | - | |
| **1,099,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **957,527,137** | **1,218,268,375** | |
| - | තැන්පතු ගෙවීම් | | 26,539,929 | 11,690,312 | ජී-2 |
| 2,000,000 | අත්තිකාරම් ගෙවීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 3,958,404 | 2,092,324 | ජී-3 |
| - | අත්තිකාරම් ගෙවීම් - අනුදත් අත්තිකාරම් | | - | - | ජී-3 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| **2,000,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **30,498,333** | **13,782,636** | |
| **1,165,455,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **1,033,667,696** | **1,269,287,478** | |
| **-** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(220,681,170)** | **(107,442,487)** | |
| - | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ගැලපුම් ශේෂය** | | (221,754,018) | (108,515,336) | ජී-5 |
| - | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 1,072,848 | 1,072,848 | ජී-1 |
| - | | | **(220,681,170)** | **(107,442,487)** | |

**3.2** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**එන්සීපී-පීටී (පී)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, උතුරු මැද පළාත.**

**2024 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | එන්සීපී-පීටීජී(4) | 90,675,496 | 62,200,627 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | එන්සීපී-පීටීජී-3 | 5,857,849 | 6,517,406 |
| මුදල් හා මුදල් සමාන දෑ | එන්සීපී-පීටීජී-1 | 1,072,848 | 1,072,848 |
| **මුළු වත්කම්** | | **97,606,193** | **69,790,881** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| පළාත් භාණ්ඩාගාර(යට/යෙන්) පියවියයුතු/ ලැබියයුතු ශුද්ධ වත්කම | | 3,341,324 | 5,166,418 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 90,675,496 | 62,200,627 |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | එන්සීපී-පීටීජී-2 | 2,516,525 | 1,350,988 |
| අග්‍රිම ශේෂය | එන්සීපී-පීටීජී-1 | 1,072,848 | 1,072,848 |
| **මුළු වගකීම්** | | **97,606,193** | **69,790,881** |

පිටු අංක ..... සිට ..... දක්වා එන්සීපී-පීටීආර් (1) සිට එන්සීපී-පීටීජී (7) දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..... සිට දක්වා ...... ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදු කර ඇති අතර, මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| …………………… | ……………… | ……………………………….. |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2025.05. | දිනය : 2025.05. | දිනය : 2025.05. |

**3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**එන්සීපී-පීටී (සී)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, උතුරු මැද පළාත.**

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | **2024** | **2023** |
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් - වැන්දඹු අනත්දරු දායක | 1,502,392 | 1,201,243 |
| වෙනත් පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 2,368,144 | 1,345,283 |
| අග්‍රිම ලැබීම් | 797,930,000 | 1,153,949,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 4,647,900 | 2,199,714 |
| අත්තිකාරම් අයකර ගැනීම් - අනුදත් අත්තිකාරම් ගිණුම් | - | - |
| තැන්පතු ලැබීම් | 27,705,466 | 12,853,473 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **834,153,902** | **1,171,548,713** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 45,353,799 | 36,888,811 |
| සහනාධාර සහ මාරුකිරීම් | 288,427 | 347,656 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද මෙහෙයුම් වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 17,266,900 | 7,505,137 |
| අත්තිකාරම් ගෙවීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 4,284,974 | 2,092,324 |
| අත්තිකාරම් ගෙවීම් - අනුදත් අත්තිකාරම් ගිණුම් | - | - |
| තැන්පතු ගෙවීම් | 26,539,929 | 11,690,312 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **93,734,029** | **58,524,240** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **740,419,873** | **1,113,024,473** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |

| | | |
|---|---|---|
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 19,884 | 23,900 |
| උපණය අයකර ගැනීම් | | - |
| ආයෝජන ආපසු ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **19,884** | **23,900** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 740,439,758 | 1,113,048,372 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වියදම් | - | - |
| වර්ෂය තුල ආයෝජනවල යෙදවුම් - මුදලින් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **740,439,758** | **1,113,048,372** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(740,419,874)** | **(1,113,024,472)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(1)** | **1** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු, වෙනත් වගකීම්, මුදල් හැර ජංගම වත්කම් වලින් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු, වෙනත් වගකීම්, මුදල් හැර ජංගම වත්කම් වලට ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ)** | **(1)** | **1** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **1,072,848** | **1,072,848** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **1,072,847** | **1,072,849** |

3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 **ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය. (අදාල නොවේ)**

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද මුළු ආදායම (රු.) | එකතු කරන ලද මුළු ආදායම අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසාන් ඇස්තමේන්තුව | | |
| - | - | - | - | - | - |

3.6 **ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්ය සාධනය.**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝජනය කරනු ලැබූ ප්‍රතිපාදනය වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 64,455,000 | 64,455,000 | 45,642,226 | 70.81% |
| **මූලධන** | 393,000,000 | 1,099,000,000 | 957,527,138 | 87.12% |
| **එකතුව** | **457,455,000** | **1,163,455,000** | **1,003,169,364** | **86.22%** |

| වැඩසටහන් නාමය * | පුනරාවර්තන | | | මූලධන | | |
|---|---|---|---|---|---|---|
| | 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම |
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | |
| පළාත් සභා පරිපාලනය | 76,455,000 | 76,455,000 | 52,747,983 | - | - | - |
| කෘෂිකර්ම සංවර්ධනය | - | - | - | 231,000,000 | 937,000,000 | 866,706,815 |
| පශු සම්පත් සංවර්ධනය | - | - | - | 150,000,000 | 150,000,000 | 83,714,565 |

*** වාර්ෂික මුදල් ප්‍රකාශයේ පිටු අංක XIV හි වර්ගීකරණය අනුව.**

3.7 ප.මු.රී 140 ප්‍රකාරව,වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේනතු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝනය කර ගන්නා ලද ප්‍රතිපාදන, වෙන් කර දුන් අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | -. | - | - | - | - |

**3.8** මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.

| වත්කම් කේතය | කේත විස්තරය | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වැය විෂයට ගිණුම්ගතවූ ශේෂය | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුලත් කල ශේෂය | 2024.12.31 දිනට වියදම් ලෙස ගිණුම් ගත උවද වත්කමක් ලෙස වාර්තා නොවූ ශේෂය(වත්කම් කළ.මෘදුකාංග යට ඇතුලත් නොවූ වටිනාකම) | වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරණ ලද වියදම වත්කම් කළ. මෘදු.හරහා වාර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 2101 | වාහන | - | - | - | - |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 9,472605.35 | 9,472605.35 | - | - |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 14,183,005.40 | 14,183,005.40 | - | - |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | - | - | - | - |
| 2105 | ඉඩම් අත්පත් කර ගැනීම | - | - | - | - |
| 2106 | වෙනත් මූලධන වත්කම් | 4,990,118.53 | 4,990,118.53 | - | - |
| 2107 | යටිතල පහසුකම් වත්කම් | | - | - | |
| 2108 | කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම | - | - | - | - |
| 2109 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |

**3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.**

- **විගණකාධිපතිගේ අංක NCPC/AN/D/PAM/FA-2024/2025/12 හා 2025 මැයි 26 දිනැතිව එවා ඇති 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව පිටු අංක 22- I සිට 22- VIII දක්වා වූ පිටු අංක මඟින් ඇතුලත් කර ඇත.**

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NCPC/AN/D/PAM/FA-2024/2025/12 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2025 මැයි 26 දින | | |

ලේකම්,
පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

ශීර්ෂය - 620 පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2024 දෙසැම්බර් 31 දිනැති අංක 2024/16 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර ඉදිරිපත් කරන ලද 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මෙහි ඇතුළත් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ, පළාත් සභාවේ අනෙකුත් ආයතනවලින් අනාවරණය වන ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සමඟ සම්පිණ්ඩනය කර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කරනු ලැබේ. එම විගණකාධිපති වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම වන ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, ප්‍රධාන ලේකම්ගේ 2024 දෙසැම්බර් 31 දිනැති අංක 2024/16 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(i) මූල්‍ය නොවන වත්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ එන්සීපී-පීටීජී (4) ආකෘතියේ වූ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව අනුව වත්කම් කාණ්ඩයන් 03 කට අදාළව අවසාන ශේෂයන් රු.40,225,412 ක් වූ නමුත් වත්කම් මෘදුකාංග අනුව එම ශේෂයන් රු.34,653,130 ක් වීමෙන් රු.5,572,282 නොසැසඳුණු වෙනසක් නිරීක්ෂණය විය.

(ii) 2024 දෙසැම්බර් 31 දිනැති අංක 2024/16 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර වෙනසට හේතු එන්සීපී-පීටීජී(3)(ii)හි දැක්විය යුතු අතර මෙම වෙනස වැය විෂයේ ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 5 හෝ රු.10,000 යන දෙකෙන් කවර හෝ වැඩි මුදලකට වඩා අඩු වන්නේ නම් වෙනසට හේතු ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවට දක්වා ඇති අතර රු.10,000ට අඩුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු වැය විෂයයන් 04ක වෙනසට හේතු දක්වා නොතිබුණි.

(ආ). අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අමාත්‍යාංශය විසින් වෙනත් ආයතන වල අත්තිකාරම් ගිණුම වෙනුවෙන් කරන ලද හරකිරීම රු.482,950 ක ශේෂය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද එන්සීපී-පීටීජී(5) අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආයතන විසින් අත්තිකාරම් ගිණුමට කරන ලද බැරකිරීම් යටතේ දක්වා තිබුණු අතර වෙනත් ආයතන විසින් අත්තිකාරම් ගිණුමට කරන ලද බැරකිරීම් රු.1,772,084 ක් අමාත්‍යාංශය විසින් වෙනත් ආයතන වල අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් කරන ලද හරකිරීම් ලෙස දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන ඡේදයේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

ප්‍රධාන ලේකම්ගේ 2024 දෙසැම්බර් 31 දිනැති අංක 2024/16 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ /ගණන් දීමෙ නිලධාරී ගේ වගකීම වේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත් ප්‍රකාරව විගණනය ස්ද්‍ර කිර්මේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම්

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 අනුකූල නොවීම

### 1.5.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ආයතන සංග්‍රහය | |
| XIX පරිච්ඡේදයේ 5.3 වගන්තිය | උපලේඛනගත නිවාස ලබා ගැනීමට හිමිකම් ඇති විවාහක නිලධරයෙකුගෙන් වැටුපෙන් සියයට 10ක් වන පරිදි නිවාස කුලී |

අයකළ යුතු වුවත් 2020 මැයි 18 දින සිට පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින මිහින්තලා පාර කුරුන්දන්කුලම ලිපිනයේ පිහිටා ඇති සංචාරක බංගලාව (අමාත්‍ය නිල නිවස) අමාත්‍ය වරයෙකු නොසිටි බැවින් එවකට කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරිය විසින් විගණන දිනය වූ 2025 අප්‍රේල් 25 දින වන විටත් භාවිතයට ගනිමින් තිබුණත් ඇයගේ වැටුපෙන් නිවාස කුලී අයකරගෙන නොතිබුණි.

| | | |
|---|---|---|
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-----------------<br>2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 හි 3.1 වගන්තිය | සෑම ඉන්ධන පරික්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත් වැඩියාවන්ගෙන් පසුව යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරික්ෂාවක් සිදු කළ යුතු වුවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාහන 02 ක් සම්බන්ධයෙන් 2022 වර්ෂයෙන් පසු ඉන්ධන පරික්ෂාවක් සිදු කර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

## 2.1. අග්‍රිම කළමනාකරණය

පළාත් මූල්‍ය රීති 259.2 ප්‍රකාරව වර්ෂය අවසානයේදී ගිණුම් පියවිය යුතු අතර, දෙසැම්බර් මාසයේ 31 දින වන විට ඉතිරි වූ අග්‍රිම ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 10 වන දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවිය යුතු වුවත් පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු.1,072,847ක් විය.

2.2 වියදම් කළමනාකරණය

2.2.1 ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා

උතුරු මැද පළාත් මූල්‍ය රීති 5.3 ප්‍රකාරව, වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර ඉකුත් වර්ෂවල නත්‍ය වියදම් සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂයේ දැරීමට අපේක්ෂිත වියදම් පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් හා පුරෝකතනයක් තුලින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට ගණන්දීමේ නිලධාරියා වගබලා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රු.66,900,000 ක අයවැයගත ප්‍රතිපාදන සලසාගත් වැය විෂයයන් 07කට, රු.13,870,000 ක පරිපූරක ප්‍රතිපාදන ලබා ගැනීම සහ පළාත් මූල්‍ය රීති 29 හා 30 මඟින් ප්‍රතිපාදන අඩු/වැඩි කර ගැනීම සහ වැය විෂයයන් ඇතිකර ගැනීම නිරීක්ෂණය විය.

(අ) පළාත් මූල්‍ය රීති 29 හා 30 මඟින් ප්‍රතිපාදන අඩුකර ගැනීම

වැය විෂයයන් 8ක මූලික වියදම් ඇස්තමේන්තුවෙන් සියයට 11 සිට සියයට 100 දක්වා පළාත් මූල්‍ය රීති 29 හා 30 අනුව වෙනත් වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරු කිරීම කර තිබුණි.

(ආ) පළාත් මූල්‍ය රීති 29 හා 30 මඟින් ප්‍රතිපාදන ලබා ගැනීම

වැය විෂයයන් 4ක මූලික වියදම් ඇස්තමේන්තුවෙන් සියයට 17 සිට සියයට 125 දක්වා පළාත් මූල්‍ය රීති 29 හා 30 අනුව ප්‍රතිපාදන ලබා ගැනීම නිරීක්ෂණය විය.

(ඇ) ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කළ නමුත් ප්‍රතිපාදන ඉතිරි වූ වැය විෂයයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. අවශ්‍යතා නිසි ලෙස පුරෝකථනය නොකර ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් වැය විෂයයන් 12 කට වෙන් කරන ලද රු.35,890,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

ii. වැය විෂයයන් 27 ක වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී එම එක් එක් වැය විෂයයන් යටතේ අධිතක්සේරු කර ප්‍රතිපාදන අනුමත කරගෙන තිබීම නිසා එම වැය විෂයයන් වල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 89 ක පරාසයක ප්‍රතිපාදන ඉතිරි කර තිබෙන බව නිරීක්ෂණය විය.

(ඇ) **ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා දක්වා තිබෙන හේතු පිළිගත නොහැකි වීම**

වැය විෂයයන් 22 ක ප්‍රතිපාදන ඉතිරිය සඳහා හේතු ලෙස, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛතාගත කර ඉන් සියයට 60 ක් සහ සියයට 80 ක් වශයෙන් ප්‍රතිපාදන ලබා දිය හැකි බව දන්වා ඇති නිසා ඒ අනුව සිදු කළ ඉතිරියක් බව දක්වා ඇතත් ඒ පරිදි කටයුතු කළේ නම් ඉතිරිය සියයට 20 සීමාව විය යුතු වුවත් එම සීමාව ඉක්මවා ඉතිරිවීම් සිදු කර තිබුණු හෙයින් ඉතිරියට හේතු ලෙස දක්වා තිබූ කරුණු විගණනයේදී පිළිගත නොහැකි විය.

03. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

3.1.1. **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පළාත්,කෘෂිකර්ම අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සහ වර්ෂය සඳහා ඉටු කිරීමට අනුමත ව්‍යාපෘති 03 ක ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 31 සිට සියයට 54 දක්වා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

3.2. **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරාගත් ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 6,666,666 ක් මුදා හැරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.15,000,000 ක් වෙන්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මත්ස්‍ය ඇඟිල්ලන් 4,730,597 ක් මුදා හැරීම සිදු කර තිබුණු අතර එහි සමස්ත ප්‍රගතිය සියයට 71 ක් පමණ විය. ඒ අතරින් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 46 ක තරම් අඩු මට්ටමක පැවතුණි.

3.3. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

2011 වර්ෂයේ සේවය අතහැර ගිය කාර්යාල කාර්ය සේවයේ නිලධාරියෙකුගෙන් අය වියයුතු රු.35,909 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

04 **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

උතුරු මැද පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර පිළිබඳ අමාත්‍යාංශයේ, කාර්ය මණ්ඩලය පිළිබඳ පරීක්ෂා කිරීමේදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩු 01 ක්ද, , ද්විතීක මට්ටමේ පුරප්පාඩු 24 ක්ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 02 ක්ද පවතින බව නිරීක්ෂණය විය.

කේ.එම්.එල්.ආරියරත්න,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත් - නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) - උතුරු මැද පළාත් සභාව

04. කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක. ( ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව )

| අනු අංකය | ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1 | මහජන පැමිණිලි | 100% | | |
| 2 | ආයතනයේ කාර්යක්ෂමතාව | 90% | | |
| 3 | ත්‍රෛමාසික කාර්ය මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීම. | 100% | | |
| 4 | විගණන විමසුම් හා ඊට යවන පිළිතුරු. | 100% | | |
| 5 | ගිණුම් කටයුතු | 93% | | |
| 6 | යාවත්කාලීන කරන ලද හා නඩත්තු කළ ලිපිගොනු සහ ලේඛන වල මාසික ප්‍රගතිය | 100% | | |
| 7 | විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධනය පිළිබද පුහුණු වැඩසටහන් | | | |
| | අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වල විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | | | 55% |
| 8 | මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය හා මත්ස්‍යයින් වැවිගත කිරීම. | | | |
| | අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වල තෝරාගත් ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිලිලන් මුදා හැරීම. | | | 67% |
| | උතුරු මැද පළාතේ ධීවරයන් සඳහා සහනාධාර පදනම මත ඔරු, කොල්ලෑ හා ධීවර ආම්පන්න ලබා දීම. | | | 38% |
| | මිරිදිය මත්ස්‍ය වගාකරුවන් සඳහා මත්ස්‍ය තත්වාරෝපිත සිමෙන්ති ටැංකි ඉදිකිරීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. | 90% | | |
| | උතුරු මැද පළාතේ පෞද්ගලික මඩ පොකුණු හිමියන්ට 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීම. | | | 31% |
| 9 | විසිතුරු මත්ස්‍ය ප්‍රවර්ධනය | | | |
| | උතුරු මැද පළාතේ විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීම. | | | 70% |
| | උතුරු මැද පළාතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය සඳහා සිමෙන්ති ටැංකි ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම හා විදුරු ටැංකි සකස් කිරීමේ ව්‍යාපෘතිය. | 90% | | |
| | උතුරු මැද පළාතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තකරුවන් සඳහා සෝල (Solar) විදුලි පද්ධතීන් ලබාදීම. | | | 66% |
| 10 | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | | | |
| | කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන හා අලෙවි | | 80% | |
| | කෘෂිකර්මය සඳහා ජලය සැපයීම. | | 75% | |
| | ව්‍යාපෘති කළමණාකරනය. | 100% | | |

**අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්**

1. අතින් රැගෙන එන ලද මහජන පැමිණිලි, අදහස් හා යෝජනා අමාත්‍යාංශය ඉදිරිපස තබා ඇති තැපැල් පෙට්ටියට බැහැලීමේ හැකියාව, තොරතුරු දැන ගැනීමේ පනත මගින් වන ඉල්ලීම් සඳහා එම පනතේ විධිවිධාන වලට යටත්ව ඉක්මන් ප්‍රතිචාර දැක්වීම, මහජන පෙත්සම් ඉදිරිපත් වූ විට එම පෙත්සම් තුලින් ඉදිරිපත් කර ඇති පැමිණිලි සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කඩිනමින් සොයා බලා  ඒ පිළිබඳව කටයුතු කිරීම.

2. ආයතනයේ කාර්යක්ෂමතාව ඉහල නංවා ගැනීම සඳහා ආයතනයේ සෑම අංශයකම උපරිම දායකත්වයක් ලැබෙන අයුරින් අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම, ලිපි ද්‍රව්‍ය භාවිතය අවම කරමින් ආයතනය තුළ හා ඉන් පිටත හැකි සෑම අවස්ථාවකදීම විද්‍යුත් තැපැල භාවිතා කර ලිපි,ලේඛන හුවමාරු කර ගැනීම, බාහිරින් ලැබෙන ලිපි සඳහා ඉක්මන් ප්‍රතිචාර දක්වමින් ඒවා අදාල අංශ වෙත යොමු කිරීම, සුදුසුකම් සම්පූර්ණ නිළධාරින් වෙත උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා පරිවාස කාල වාර්තාවන් නියමිත කාල වලදී සිදු කිරීම, මාණ්ඩලික නිළධාරි රැස්වීම් හා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නිසි කාලයන් තුළ පැවැත්වීම හා කාර්යක්ෂමතා හා ඵලදායි මට්ටමේ පුහුණු වැඩසටහන් ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම.

3. අදාල කාල සීමාවන් තුල ආයතනයේ සේවයේ නියුතු නිළධාරින්ගේ කාර්යමණ්ඩල වාර්තා හා ඊට අදාල තොරතුරු නිවැරදිව යාවත්කාලීන කරමින් ආයතන කටයුතු කායීක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම.

4. ආයතනයට ලැබෙන විගණන විමසුම් හා විගණකාධිපති වාර්තා සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමද,  එම විමසුම් හා වාර්තාවලින් පෙන්වා දෙන සියලුම අඩුපාඩුද කඩිනමින් නිරවුල් කරගනිමින් නිවැරදි ගිණුම් හා පාලන කටයුතු හරහා ආයතනයේ කාර්යක්ෂමතාවය උපරිම වන ලෙස කටයුතු කිරීම.

5. සියලුම වවුචර්පත් හා අනෙකුත් සියලු ගෙවීම් නියමිත කලය තුළ සිදු කරමින් වැය ලෙජරය, මුදල් පොත, වැටුප් ලේඛනය, පොදු තැම්පත් ලේඛනය, සමාජික ණය ලේඛනය වැනි ලේඛන නිවැරදිව පවත්වාගෙන යාම තුලින් මාසික ගිණුම් සාරාංශ, බැංකු සැසඳුම් ප්‍රකාශනය ඇතුලු අනෙකුත් වාර්තාවන්  නියමිත කාලයන් තුල නිවැරදිව ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, වාහන භාවිතය විධිමත්ව සිදු කිරීම මෙන්ම වාර්ෂික අයවැය සකස් කිරීම, මූල්‍ය ප්‍රකාශනය හා අත්තිකාරම් බී ගිණුම් ප්‍රකාශනය නියමිත කාලයන් තුළ ඉදිරිපත් කිරීම, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීම වැනි කාර්යයන් හරහා ආයතනයේ ගිණුම් කටයුතු කාර්යක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීම.

6. ආයතනයේ සෑම විෂයක් සඳහාම විෂය ගොනු ලේඛනයක් පවත්වාගෙන යාම තුළින් ලිපි ගොනුවල ආරක්ෂාව මෙන්ම රාජකාරී කටයුතු ඉටු කිරීමේදී එම ලිපිගොනු කඩිනමින් සොයාගැනීමට පහසුවක් ඇති වන ආකාරයට ආයතනය තුළ පවතින නිවරදි කාර්යාල ක්‍රම වලට අනුගත වෙමින් කාර්යක්ෂමව නිවැරදි වූ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම, ස්ථාන මාරුවීම් වැනි අවස්ථාවන් වලදී ස්ථානමාරු වී පැමිණෙන නිලධාරින්ගේ ලිපිගොනු භාර ගැනීම හා භාර දීම විධිමත්ව සිදු කිරීම හා ලේඛනාගාරයක් පවත්වාගෙන යෑම වැනි කටයුතු ඉටු කිරීම.

**7.** අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන් මුල්කර ගනිමින් විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධන කටයුතු නිසිලෙස නිවැරදිව ඵලදායි අයුරින් ඉටුකර ගැනීම. එම වැඩසටහන් සඳහා රුපියල් මිලියන 2.8 ක ප්‍රතිපාදන 2024 වර්ෂය සඳහා අනුමත වී ඇති අතර, එම ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වූ ධාරිතා සංවර්ධන වැඩසටහන් මගින් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධනය මෙන්ම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදි. මෙම ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 1,516,005.00 කි.

8. රුපියල් මිලියන 22 ක ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වූ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය හා මත්ස්‍යයින් වැවිගත කිරීම වැනි ව්‍යාපෘති මගින් පළාතේ හඳුනාගත් ජලාශ සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත මත්ස්‍ය ඇඟිල්ලන් 4,730,597 ක් මුදාහැරීම හා 50 % ප්‍රතිලාභ දායකත්වය මත ධීවරයන් 143 ක් සඳහා ඔරු, කොල්ලෑ හා ධීවර උපකරණ ලබාදීම ද මිරිදිය මත්ස්‍ය වගාකරුවන් 10 දෙනෙක් සඳහා තත්වාරෝපිත සිමෙන්ති ටැංකි ඉදිරිකරීම හා සංවර්ධනය කිරීම මෙන්ම උතුරු මැද පළාතේ පෞද්ගලික මඩ පොකුණු හිමියන්ට 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීම ද සිදුකර ඇති අතර, එම ව්‍යාපෘති සියල්ල සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 13,421,735.96 කි. මෙම ව්‍යාපෘති මගින් ආයතනයේ කාර්ය සාධන මට්ටම මෙන්ම පළාතේ මත්ස්‍ය අස්වැන්න ද ඉහල මට්ටමකට ගොස් ඇති අතර, ඒ සඳහා යෝජිත වූ ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

9. විසිතුරු මත්ස්‍ය ප්‍රවර්ධනය යටතේ රුපියල් මිලියන 16.6 ක ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති යටතේ එක් අදියරක් ලෙස විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය කිරීමේ නිරත ව්‍යවසායකයින් සඳහා 50% ප්‍රතිලාභ දායකත්වය මත විසිතුරු උපකරණ ලබා දීම සිදුකර ඇත. එම ව්‍යාපෘතිය යටතේ වටදැල් 350, සෙවන දැල් 75, කුරුළු දැල් 100 ප්‍රතිලාභීන් අතර බෙදා දීම සිදුකර ඇති අතර, ඒ සඳහා වැයවූ සමස්ථ වියදම රුපියල් 5,972,579.12 කි. තවත් අදියරක් ලෙස සිමෙන්ති ටැංකි ඉදිකිරීම, අලුත් වැඩියා කිරීම සහ වීදුරු ටැංකි සකස් කිරීම සම්බන්ධ ව්‍යාපෘති ආරම්භ කර ඇති අතර, ඒ සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 4,100,000.00 කි. විසිතුරු මත්ස්‍ය ප්‍රවර්ධනය යටතේ සෝලා විදුලි පද්ධතීන් ලබාදීම ද සිදු කර ඇති අතර, ඒ සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 2,323,680.02 කි. ඒ අනුව මෙම ව්‍යාපෘති අදියරයන් සියල්ල මගින් ආයතනයේ සමස්ථ කාර්යසාධන මට්ටම මෙන්ම පළාතේ විසිතුරු මත්ස්‍ය ප්‍රවර්ධන මට්ටම ඉහලට ගෙන ගොස් ඇති අතර, ඒ සඳහා පැවති ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

10. ලෝක බැංකු හා ශ්‍රී ලංකා රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය 2024 වර්ෂයේ රුපියල් මිලියන 706 ක් උපයෝජනය කරමින් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධනය කිරීම , කෘෂිකර්මය සඳහා ජලය සැපයීම හා ව්‍යාපෘති කලමනාකරණය ආදී ක්ෂේත්‍රයන් ඔස්සේ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරමින් කෘෂිකාර්මික කටයුතු වල ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා කටයුතු සලසා දී ඇත.

## 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2024 වර්ෂය තුළ ඉටුකළ කාර්යය | එම දර්ශක අනුව 2024 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%- 74% | 75% 100% |
| 1.සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම (4,730,597)mt | ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් මුදා හැරීම. | ග්‍රාමීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ජලාශ 113 ක් සඳහා මත්ස්‍ය පැටවුන් මුදා හැරීම. | | √ | |
| | උතුරු මැද පළාත් ධීවරයන් සඳහා සහනාධාර පදනම මත ඔරු,කොල්ලෑ හා ධීවර උපකරණ ලබාදීම. | ධීවර කාර්මිකයින් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | ධීවර කාර්මිකයින් 32 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | √ | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | උතුරු මැද පළාත් මිරිදිය මත්ස්‍ය වගාකරුවන් සඳහාමත්ස්‍ය තත්වාරෝපිත සිමෙන්ති ටැංකි ඉදිකිරීම හා සංවර්ධනය කිරීම. | ධීවර කාර්මිකයින් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | ධීවර කාර්මිකයින් 10 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම | √ | | |
| 2. සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | උතුරු මැද පළාත් මඩ පොකුණු හිමියන්ට උපකරණ ලබාදීම. | ධීවර කාර්මිකයින් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | ධීවර කාර්මිකයින් 15 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | √ | | |
| | උතුරු මැද පළාත් විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා SOLAR විදුලි පද්ධති ලබාදිම. | 50% ප්‍රතිලාභී දායකත්වය මත | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 05 ක් සඳහා SOLAR විදුලි පද්ධති ලබාදිම. | | √ | |
| | උතුරු මැද පළාත් විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා සිමෙන්ති ටැංකි ඉදිකිරීම,අළුත්වැඩියා කිරීම වීදුරු ටැංකි සකස් කිරීම. | 50% ප්‍රතිලාභී දායකත්වය මත | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 41 ක් සඳහා. | | | √ |
| | උතුරු මැද පළාත් විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා උපකරණ ලබාදිම. | 50% ප්‍රතිලාභී දායකත්වය මත | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 87 ක් සඳහා. | | √ | |

## 5.2 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

- **තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ආයතනය ලත් ජයග්‍රහන**

තිරසර සංවර්ධන අරමුණු 01 හා 02 යටතේ දැක්වෙන සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යටතේ සඳහන් 2030 වනවිට අපේක්ෂිත තත්වය ළඟාකර ගැනීම සඳහා අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් තුළින් සුවිශාල දායකත්වයක් සපයයි. එබැවින් 2030 වනවිට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් මගින් ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුතු, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම වෙනුවෙන් අවශ්‍ය වූ කාර්යයන් සාර්ථක අයුරින් අමාත්‍යාංශය මගින් ක්‍රියාවට නංවා ඇත.


ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් බහාලීමෙන් සෘජුවම නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීමට කටයුතු කිරීම මෙන්ම මිරිදිය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් සඳහා ප්‍රතිලාභී දායකත්වය මත උපකරණ සැපයීමේ වැඩසටහන මගින් නිෂ්පාදකයින් තව තවත් මෙම කර්මාන්තය කෙරෙහි දිරිමත් කිරීම සිදුකර ඇත.

2018 වසරේ සිට 2024 වසර දක්වා පළාත තුළ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතයේ ප්‍රවණතා පහත අයුරින් දැක්විය හැකිය.

**<u>පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතය 2018 - 2024 (Mt)</u>**

| වර්ෂය | අනුරාධපුර | පොළොන්නරුව | උතුරු මැද පළාත |
|---|---|---|---|
| 2018 | 19,940 | 11,600 | 24,540 |
| 2019 | 17,840 | 9,960 | 27,800 |
| 2020 | 21,855 | 9,505 | 31,360 |
| 2021 | 19,330 | 8,690 | 28,010 |
| 2022 | 21,800 | 13,668 | 35,468 |
| 2023 | 21,338 | 10,266 | 31,604 |
| 2024 | 21,379 | 10,771 | 32,150 |

**මූලාශ්‍රය - ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**





ජාතික මට්ටමේ මිරිදිය නිෂ්පාදිතය තුළ උතුරු මැද පළාතේ දායකත්වය 2018 වසරේ සිට 2024 වසර දක්වා පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

## ජාතික මට්ටමේ මිරිදිය නිෂ්පාදිතය හා පළාත් දායකත්වය 2018-2024

| වර්ෂය | ජාතික නිෂ්පාදිතය(mt) | උතුරු මැද පළාත් නිෂ්පාදිතය (mt) | ජාතික නිෂ්පාදිතයට පළාත් දායකත්වය |
|---|---|---|---|
| 2018 | 88,010 | 24,540 | % 28 |
| 2019 | 90,580 | 27,800 | % 31 |
| 2020 | 102,220 | 31,360 | % 31 |
| 2021 | 104,450 | 28,020 | % 27 |
| 2022 | 116,890 | 35,468 | % 30 |
| 2023 | 114,850 | 31,604 | 28% |
| 2024 | 103,120 | 32,150 | %31 |

**මූලාශ්‍රය - ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය**




දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය - උතුරු මැද පළාත

| ව්‍යාපෘතිය | සංරචකය | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | වැයකළ මුදල රු. මිලියන |
|---|---|---|---|---|
| දේශගුණික සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය | කෘෂිකර්ම නිෂ්පාදන සහ අලෙවිය | අතරමැදි කන්නය | හිගුරක්ගොඩ,හොරොව් පොතාන,කහටගස්දිගිලිය,ගලෙන්බිදුනුවැව, නොච්චියාගම මහ වාලච්චිය,නැගෙනහිර නුවරගම් පළාත | 6.46 |
| | | යල කන්නය | | 72.18 |
| | | මහ කන්නය | | 8.63 |
| | | කෘෂි ළිං | | 60.12 |
| | | කෘෂි පාර | | 20.18 |
| | | කමත් | | 29.59 |
| | | කමත් අතුරුණු | | 10.58 |
| | | සෝලාර් | | 33.25 |
| | | කෘෂි සැසි පැවැත්වීම | | 3.91 |
| | | | | |
| | කෘෂිකර්මය සඳහා ජලය | වැව් ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් ගොවින් දැනුවත් කිරීම | | **1.72** |
| | | වැව් | | **374.24** |
| | | එල්ලංගා පද්ධති කළමනාකරණය කිරීම | | **10.63** |
| | පරිපාලන | වේතන සහ නඩත්තු වියදම් | | **74.51** |
| | එකතුව | | | **706.00** |

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 04 | 03 | 01 |
| තෘතියික | 01 | 01 | - |
| ද්විතියික | 55 | 31 | 24 |
| ප්‍රාථමික | 13 | 11 | 02 |
| එකතුව | 73 | 46 | 27 |

**6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

ඉහත දක්වා ඇති දත්ත අනුව අමාත්‍යාංශය තුළ ජ්‍යෙෂ්ඨ,තෘතියික, ද්විතික හා ප්‍රාථමික කාර්ය මණ්ඩල වල හිඟයක් පෙන්නුම් කරනු ඇත. මෙම හිඟය ආයතනයේ කාර්ය සාධනය උදෙසා පහත පරිදි බලපානු ඇත.

- **ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.**

  අමාත්‍යාංශයේ සහකාර ලේකම් (මුදල්) නිලධාරි පුරප්පාඩු පවතී. මෙම පුරප්පාඩු හේතුවෙන් ආයතනයේ පරිපාලනමය කටයුතු අපහසු වීම.

- **ද්විතීයික කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම**.

  ද්විතික කාර්ය මණ්ඩලයට අයත් කළමනාකරණ සේවා නිළධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ආයතනික කටයුතු ඵලදායි අයුරින් සිදු කිරිම ගැටලුවක් වී ඇත . තවද සංවර්ධන නිළධාරී පුරප්පාඩු හේතුවෙන් සංවර්ධන කටයුතු මෙහෙයවීම , ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිලාභින් හා ආයතන අතර සම්බන්ධීකරණයට ගැටළු ඇති ව ඇත.

- **ප්‍රාථමික කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම**.

  ක්ෂේත්‍ර හා කාර්යාල කටයුතු සඳහා ප්‍රමාණවත් අයුරින් කාර්ය මණ්ඩලය නොමැති හෙයින් කාර්යාලීය සනීපාරක්ෂක කටයුතු සඳහා බාධා ඇතිව ඇත.

**6.3** **මානව සම්පත් සංවර්ධනය**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව(දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| උපාය මාර්ගික සැලැස්ම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන. | 02 | දින 01 | | | දේශීය | උපාය මාර්ගික සැලැස්ම පිළිබඳ දැනුම |
| මානව සම්පත් සංවර්ධන සැලසුම සකස් කිරීම | 03 | දින 01 | | | දේශීය | මානව සම්පත් සංවර්ධන සැලසුම සකස් කිරීමට අදාල දැනුම ලබා ගැනීම. |
| මානව සම්පත් සංවර්ධන සැලැස්ම වැඩි දියුණු කිරීම. | 03 | දින 01 | | | දේශීය | මානව සම්පත් සංවර්ධන සැලැස්ම වැඩිදියුණු කිරීම පිළිබඳ දැනුම |
| පුහුණු කළමනාකරණ පද්ධතිය | 01 | දින 01 | | | දේශීය | පුහුණු කළමනාකරණ පද්ධතිය පිළිබඳ හා ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම |
| උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ වැඩසටහන | 01 | දින 01 | | | දේශීය | උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම පිළිබඳ දැනුම |
| Australian Awards Scholarship දැනුවත් කිරීමේ වැඩසටහන | 02 | දින 01 | | | දේශීය | Australian Awards Scholarship දැනුවත් කිරීමේ වැඩසටහනට අදාල දැනුම |
| SMART රියදුරෙක් ප්‍රමිතිගත රියදුරු සේවයක් | 02 | දින 02 | | | දේශීය | රියදුරු සේවය ප්‍රමිතිගත කිරීමට අදාල දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| භාණ්ඩ සමීක්ෂණ පුහුණුව | 01 | දින 02 | | | දේශීය | භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම පිළිබඳ දැනුම |
| පරිසර කළමනාකරණය | - | දින 01 | | | දේශීය | පරිසර කළමනාකරණය පිළිබඳ දැනුම |
| වැටුප් සැකසීමේ මෘදුකාංගය පුහුණුව (PAYROLL ) | 01 | දින 01 | | | දේශීය | වැටුප් සැකසීම පිළිබඳ දැනුම |
| ස්ථිර පත්වීම් ලද බහුකාර්ය නිලධාරි ප්‍රාරම්භක පුහුණු වැඩමුළුව 01 කණ්ඩායම | 01 | දින 01 | | | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම ක්‍රියාවට නැංවීම පිළිබඳ දැනුම |
| ව්‍යාපෘති කළමනාකරණය | 01 | දින 04 | | | දේශීය | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම |
| විවෘත හා වගකිවයුතු රජයක් සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම ක්‍රියාවට නැංවීම. | 01 | දින 01 | | | දේශීය | රාජ්‍ය නිලධාරින්ගේ වගකීම ක්‍රියාවට නැංවීම පිළිබඳ දැනුම |
| භාණ්ඩ සමීක්ෂණ පුහුණුව | 01 | දින 01 | | | දේශීය | භාණ්ඩ සමීක්ෂණ සඳහා අදාල දැනුම |
| රැකියා විස්තරය සකස් කිරීම | 04 | දින 01 | | | දේශීය | රැකියා විස්තර සකස් කිරීම පිළිබඳ දැනුම |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ලිපිගොනු කළමනාකරණය | 04 | දින 01 | | | දේශීය | ලිපිගොනු නඩත්තුව හා ලිපිගොනු කළමනාකරණය පිළිබඳ දැනුම |
| අත්තිකාරම් ගිණුම් පුහුණුව | 01 | දින 01 | | | දේශීය | අත්තිකාරම් ගිණුම් සකස් කිරීම පිළිබඳ දැනුම |
| ආයතන සංග්‍රහය ,කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි | 04 | දින 01 | | | දේශීය | ආයතන සංග්‍රහය, කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම |
| වැටුප් සැකසීමේ මෘදුකාංගය | 01 | දින 03 | | | දේශීය | වැටුප් සැකසීමේ මෘදුකාංගය පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වත්කම් කළමනාකරණ මෘදුකාංගය (විෂය භාර නොවන නවක නිලධාරීන් සඳහා) | 02 | දින 01 | | | දේශීය | වත්කම් කළමනාරණය පිළිබඳ දැනුම |
| පරිගණක සාක්ෂරතාවය | 01 | දින 02 | | | දේශීය | පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම |
| ආයතන අංශය සඳහා වැඩපියවර සකස් කිරීම | 06 | දින 01 | | | දේශීය | ආයතන අංශ සඳහා වැඩපියවර සකස් කිරීම පිළිබඳ දැනුම |
| වාහන හා වාහන ලිපිගොනු නඩත්තුව | 02 | දින 02 | | | දේශීය | වාහන හා වාහන ලිපිගොනු නඩත්තුව පිළිබඳ දැනුම |
| වැටුප් පරිවර්තන සකස් කිරීම | 03 | දින 02 | | | දේශීය | වැටුප් පරිවර්තන සකස් කිරීම පිළිබඳ දැනුම |
| ගබඩා කළමනාකරණය | 01 | දින 01 | | | දේශීය | ගබඩා කළමනාරකණය පිළිබඳ දැනුම |
| කාර්යාල කාර්ය සහායක සේවයේ නිලධාරින් සඳහා රාජකාරි පුහුණුව | 02 | දින 01 | | | දේශීය | කාර්යාල කාර්ය සහායක සේවයේ නිලධාරින්ගේ රාජකාරි පිළිබඳ දැනුම |
| කළමනාකරණ සංකල්ප | 01 | දින 01 | | | දේශීය | කළමනාකරණ සංකල්ප පිළිබඳ දැනුම |
| ලේඛනාගාර නඩත්තුව පිළිබඳ පුහුණුව | 04 | දින 01 | | | දේශීය | ලේඛනාගාර නඩත්තුව පිළිබඳ දැනුම |
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 03 | දින 01 | | | දේශීය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම |
| රැකියා ස්ථානීය පුහුණුව හා ඇගයීම (TMS සම්බන්ධීකාරකවරුන් සඳහා) | 01 | දින 01 | | | දේශීය | රැකියා ස්ථානීය පුහුණුව හා ඇගයීම පිළිබඳ දැනුම |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූයේ කෙසේදෙ? යන්න කෙටියන් පැහැදිලි කරන්න.

- පුහුණු වැඩසටහන් මගින් අදාල නිලධාරින්ගේ න්‍යායාත්මක දැනුම වර්ධනය වන අතර, එමගින් මහජනතාවට ඵලදායි සේවයක් ලබාදීමට ඇති හැකියාව වර්ධනය වේ.

- ආයතනයේ මෙහෙයුම් කටයුතු නිවැරදි අයුරින් පවත්වාගෙන යාමට හා ආයතනයේ අරමුණු හා ඉලක්ක සාර්ථකව සපුරා ගැනීමටත් පුහුණු වැඩසටහන් දායක වේ.

- විවිධ ක්ෂේත්‍ර ආවරණය වන අයුරින් නිලධරයන් විවිධ පුහුණු වැඩසටහන් වලට ඉදිරිපත් කිරිම තුළින් ඔවුන්ට ආයතනයේ සියලු රාජකාරී කටයුතු පිලිබද පුළුල් අවබෝධයක් දැනුමක් ලබා ගැනීමට හැකියාව පවතින අතර, නිලධාරින් ඕනෑම ස්ථානයක ඕනෑම රාජකාරී කටයුත්තක් කිරිමට සුදුසු පුද්ගලයෙකු බවට පත් කිරිම මෙම පුහුණු වැඩසටහන් මගින් සිදුවන ප්‍රධානම කර්තව්‍යයකි.

- පුහුණු වැඩසටහන් මගින් නිලධාරින්ගේ දැනුම, ආකල්ප වර්ධනය වීම මගින් ආයතනය තුලින් රටෙහි අපේක්ෂා කරන දායකත්වය ඉහල මට්ටමක පවත්වා ගෙන යාමට හැකි වේ.

## 07.පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදළ කර ගතයුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **<u>පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද?</u>** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ. | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම. | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්. (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම්. | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම්. | - | - | - |
| 1.6 | වෙනත් ගිණුම්. | - | - | - |
| | | | | |
| **2** | **<u>පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (ප.මු.රී 321)</u>** | | | |
| 2.1 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2014/14 හා 2016/10 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.(ප.ස 37 පෝරමය) | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (ප.ස 32 පෝරමය) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **3** | **<u>මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (ප.මු.රී 83)</u>** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා සිදුවන පරිදී බලතල පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණරාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 3.5 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2022.11.23 දිනැතිව නිකුත් කර ඇති අංක 04/2022 චක්‍රලේඛය හා 2023.01.05 දිනැතිව පළාත් භාණ්ඩාගාර විසින් නිකුත් කර ඇති NCP/CS/PT/ICTO/GPS දරන ලිපියට අනුකූලව GPS මෘදුකාංගය හරහා වැටුප් සකස් කිරීම. | අනුකූල වේ | | |
| | | | | |
| **4** | **<u>වාර්ෂික සැලසුම් සකස් කිරීම</u>** | | | |
| 4.1 | නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | නියමිත දිනට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | නියමිත දිනට වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට පළාත් අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 4.5 | නියමිත දිනට වාර්ෂික අග්‍රිම සීමා වාර්තාව පළාත් භාණ්ඩාගාර ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| | | | | |
| | | | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | - | - |
| 6.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, වසර ආරම්භයේ දී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | - | - |
| 6.3 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | පළාත් සභාව සතු වත්කම් කළමණාකරණය සම්බන්ධ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2014/14 හා 2016/10 අනුව වත්කම් මිලදී ගැනීම, නිකුත් කිරීම හා අපහරණය කිරීම පිළිබඳ කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | කොන්ට්‍රෝල ජනරාල්ගේ අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | | | |
| 8.3 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක2020/14 අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරිම ප.මු.රී 490 අනුව සිදු කිරීම. | අනුකූල වේ | - | - |
| 8.6 | කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ 2022.09.09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 ප්‍රකාරව ආයතනයේ එකත් වී ඇති අබලි ද්‍රව්‍ය බැහැර කර තිබීම. | අනුකූල වේ | | |
| | | | | |
| **9** | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම ප.මු.රී 54 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල නොවේ | *අනතුරු සිදුවී නැත. | - |
| 9.5 | ප්‍රධාන ලේකම්ගේ NCP/CP/FD/08 හා 2017.08.08 දිනැති ලිපිය ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම. | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාල නොවේ | * කල්බදු වාහන නොමැත. | - |
| | | | | |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසදුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | *අක්‍රීය බැංකු ගිණුම් නැත. | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **11** | **<u>ප්‍රතිපාදන උපයෝජනය</u>** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | ප.මූ.රී. 46 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **12** | **<u>රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්</u>** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල නොවේ | *එච්.එම්.සී.බී.හේරත් මහතා වෙත සමථ මණ්ඩලය මඟින් මාසිකව රු.1500 බැගින් ගෙවන ලෙස දන්වා ඇති අතර එය 2024 ජනවාරි සිට ගෙවා නොමැත. ගෙවන ලෙස දැනුම් දී සිහි කැඳවීම් ද යවා ඇත. | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | ප්‍රතිපාදන මුදල් හිඟ වීම හේතුවෙන් ණයශේෂ නිරවුල් කිරීම කල නොහැකිවූ අතර, ප්‍රතිපාදන ලද විගස ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. | - |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **13** | **<u>පොදු තැන්පත් ගිණුම</u>** | | | |
| 13.1 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | - | - |
| 13.2 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 572 අනුව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **14** | **<u>අග්‍රිම ගිණුම</u>** | | | |
| 14.1 | ප.මු.රී. 259 අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | ප.මු.රී. 261 ප්‍රකාරව, නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී සතියක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | ප.මු.රී. 261 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **15** | **<u>ආදායම් ගිණුම</u>** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට රැස් කරනු ලබන අවස්ථාවේම සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 15.3 | ප.මු.රී. 116 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| | | | | |
| **16** | **<u>මානව සම්පත් කළමනාකරණය</u>** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවත්වාගෙන යාම හා වැටුප් ගෙවීම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **17** | **<u>මහජනයා වෙත තොරතුරු ලබා දීම</u>** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **18** | **<u>පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම</u>** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (I)දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **19** | **<u>මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.</u>** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම . | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ | *02/2018 (I) චක්‍රලේඛය අනුව සකස් කිරීම අවශ්‍ය නොවන බව දක්වා ඇත. | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **20** | **<u>විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.</u>** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | - | - |

ආර්.එම්.ජී.සේනාරත්න,
ලේකම් ,
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා
සත්ත්ව සෞඛ්‍ය,සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

සකස් කළේ,

අත්සන : …………………….

නම : ඒ.එච්.එස්.අයි.එම්.මැණිකේ

තනතුර : කළමනාකරණ සේවා නිලධාරි

අධීක්ෂණය,

අත්සන : …………………….

නම : බී.පී.බාලසූරිය

තනතුර : මුදල් සහකාර

අනුමත කරමි,

අත්සන : …………………….

නම : ආර්.එම්.ජී.සේනාරත්න

තනතුර : ලේකම්, කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, උතුරු මැද පළාත.